වී කරල



යුක්රේන ජනකතාවකි

වී කරල

යුක්රේන ජනකතාවකි

චිත්‍ර-යූරි වස්නෙට්සොව්

Kanol

වී කරල

යුක්රේන ජනකතාවකි

පරිවර්තනය
දූදිගම වී. රුද්රිගු

චිත්‍ර
යූරි වස්නෙට්සොව්

නව සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-22-5

ප්‍රකාශනය
කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
රොනැට් එන්ටප්‍රයිසස්

මුද්‍රණය 2012

එකෝමත් එක රටක මී පැටවු දෙදෙනෙක් හිටියා එකෙකුගේ නම කැරකෙන පැංචා. අනිකාගේ නම පෙරළෙන පැංචා. තවත් එක් හඬලන රාල කෙනෙකුත් හිටියා.හඬලන රාල උදේ පාන්දර නැගිටලා කොක්කො කෝ කෝ කියල හඬලනවා. වැඩ කරන්න පටන් ගන්නවා. කැරකෙන පැංචයි, පෙරළෙන පැංචයි උදේ හිටන් රෑ වන තුරු සින්දු කියනවා, නටනවා, කරකැවෙනවා, පෙරළෙනවා.



දවසක් දා හඬලන රාල මිදුල අතුගෑවා. එවිට ඔහුට ලොකු වී කරලක් හම්බ වුණා.

"කැරකෙන පැංචෝ, පෙරළෙන පැංචෝ, මෙහෙ වරෙල්ලා, මෙන්න බලාපල්ලා මට වී කරලක් හම්බ වුණා."

මී පැටවු දෙදෙනා දුවගෙන ඇවිල්ලා මෙහෙම කියනවා.

"වී ටික සුද්ද කරලා ගන්න ඕන"

"වී කොටන්නේ කවුද?" හඬලන රාල ඇහුවා.

"මම නොවෙයි" කැරකෙන පැංචා කිව්වා.

"මම නොවෙයි" පෙරළෙන පැංචා කිව්වා.

"හොඳයි, මම වී ටික සුද්ද කරන්නම්" කියලා හඬලන රාල වී සුද්ද කළා.

මී පැටව් දෙන්නා සෙල්ලම් කළා.



වී සුද්ද කරලා හඬලන රාල මෙහෙම කියනවා.

"කැරකෙන පැංචෝ, පෙරළෙන පැංචෝ, මම කොච්චර කැකුළු හාල් එකතු කළා ද කියලා බලාපල්ලා!"

මී පැටව් දෙදෙනා ඇවිදින් එක හඬින් මෙහෙම කියනවා. "දැන් ඉතින් කැකුළු හාල් ටික මෝලට දීලා හාල් පිටි කරගන්නට ඕන!"

"වී මෝලට හාල් ටික ගෙනියන්නේ කවුද?" හඬලන රාල ඇහුවා.

"මම නොවෙයි" කැරකෙන පැංචා කිව්වා.

"මම නොවෙයි" පෙරළෙන පැංචා කිව්වා.

"හොඳයි මම ගෙනියන්නම්" හඬලන රාල හාල් මිටිය කරේ තියාගත්තා.

මෝලට ගෙනියලා කැකුළු හාල් ටික පිටි කර ගත්තා.

මී පැටව් දෙන්නා සෙල්ලම් කළා. එකෙකුගේ පිටට උඩින් අනිකා පනිනවා. හිනා වෙනවා. සතුටු වෙනවා.

හඬලන රාල පිටි මිටිය කර ගහගෙන ගෙදර ඇවිත් මී පැටවුන්ට කතා කළා

"කැරකෙන පැංචෝ, පෙරළෙන පැංචෝ, මම පිටි ගෙනාවා."

"අපේ කුකුළා හරි හපනා, අපේ කුකුළා හරි හපනා! දැන් ඉතින් පිටි අනලා රොටි පුච්චන්න ඕන!"

"පිටි අනන්නේ කවුද?" හඬලන රාල ඇහුවා.

"මම නොවෙයි" කැරකෙන පැංචා කිව්වා.

"මම නොවෙයි" පෙරළෙන පැංචා කිව්වා.

හඬලන රාල කල්පනා කරලා, කල්පනා කරලා මෙහෙම කිව්වා.

"මට තමා පිටි අනන්න සිද්ද වෙලා තියෙන්නේ"

හඬලන රාල පිටි ඇනුවා. දර කඩාගෙන ඇවිත්, ලිපට දර දාලා, ලිප පත්තු කළා. රොටි හදලා පෝරනුවට දැම්මා.

මී පැටව් දෙන්නත් නිකම් හිටියේ නැහැ. සින්දු කිව්වා, නැටුවා, උඩ පැන්නා.



රොටී රන්වන් පාටයි, පුසුඹයි. හඬලන රාල රොටී ගෙනල්ලා මේසය උඩ තැබුවා. මී පැටව් දෙන්නා එක පාරටම මේසය උඩට ආවා. අඬගහන තුරු හිටියේ නැහැ.

"අනේ මට නම් බොහොම බඩගිනියි" කැරකෙන පැංචා කිව්වා.

"අනේ මටත් බොහොම බඩගිනියි" පෙරළෙන පැංචා කිව්වා.

මී පැටව් දෙදෙනා රොටි ලැබෙන තුරු බලාගෙන ඉන්නවා.

හඬලන රාල උන්ට මෙහෙම කිව්වා.

"පොඩ්ඩකට නැවතියල්ලා! වී කරල ඇහින්දේ කවුද?"

"අපේ කුකුළා!" මී පැටව් දෙන්නා කිව්වා.

"වී සුද්ද කළේ කවුද?"

"අපේ කුකුළා" මී පැටව් දෙදෙනා කිව්වා.

"හාල් ටික මෝලට ගෙනිච්චේ කවුද?"

"අපේ කුකුළා, අපේ හඬලන රාල" මී පැටව් දෙන්නා කිව්වා. හැබැයි ඒගොල්ල දැන් පිළිතුරු දෙන්නේ බොහොම හෙමින්.

කුකුළා ආයෙමත් අහනවා.

"පිටි ඇනුවේ කවුද? දර කැඩුවේ කවුද? ලිප පත්තු කළේ කවුද? රොටී පිච්චුවේ කවුද?"

මී පැටව් දෙන්නා බොහොමත්ම හෙමින් පිළිතුරු දුන්නා.

"අපේ කුකුළා, අපේ හඬලන රාල" ඒ ගොල්ලන්ට වෙන කියන්න දෙයක් නැහැ.

මී පැටව් දෙන්නා හෙමිහිට මේසයෙන් බිමට බැස්සා, හඬලන රාල ඔවුන්ව නැවැත්තුවේ නැහැ.

ඒ වගේ කම්මැලියන්ට, වැඩ නොකර පිනට කෑම ඉල්ලන අයට රොටී දෙන්නේ නැහැ!

වී කරල

යුක්රේන ජනකතාවකි



Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 011 4336779

ISBN 978-955-1979-22-5
Rs. 100/-